සබරගමුව පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභාවක්‍රලේඛ ලිපි අංක - 40/2026

මගේ අංකය :- PPSC/ES/07/FI/6/3/8
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
පළාත් සභා කාර්යාල සංකීර්ණය
සබරගමුව පළාත
නව නගරය, රත්නපුර
2026.10.12

පිටපත්:-
01. ප්‍රධාන ලේකම්. ස.ප.ස.
02. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, ස.ප.ස.
03. පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,ස.ප.ස.
04. පළාත් පාලන සහකාර කොමසාරිස්, රත්නපුර / කෑගල්ල.

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ II ශ්‍රේණියේ විමර්ශන නිලධාරින්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය- 2026**

2026 වසරේ පැවැත්වීමට නියමිත සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ II ශ්‍රේණියේ විමර්ශන නිලධාරින්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා මින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. එබැවින් මෙම චක්‍රලේඛ ලිපිය ඔබ ආයතනයේ සිටින දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු II ශ්‍රේණියේ විමර්ශන නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.

03. මෙම චක්‍රලේඛ ලිපියට අමුණා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පතක් මඟින් එම පරික්ෂණයට අයදුම් කළ යුතු වේ. එම අයදුම්පත් **2026 නොවැම්බර් මස 06** වන දිනට ප්‍රථම තම ආයතන ප්‍රධානියා මඟින් මා වෙත ලැබෙන සේ එවිය යුතු වේ.

04. මෙම විභාගය ලිඛිත විභාගයක් වන අතර, ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. උපරිම ලකුණු 100 කි. සාමාර්ථය සඳහා අවම වශයෙන් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40 ක් ලබා ගත යුතුය. විභාගයේ විෂය නිර්දේශය පහතින් දක්වා ඇත.

| ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | විෂය නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන අණ පනත් හා පළාත් පාලන ආයතනවල සේවා හා නෛතික නියමයන් | පැය 03 | 01. මහ නගර සභා , නගර සභා ආඥා පනත් සහ ප්‍රාදේශීය සභා පනතේ මහජන උපයෝගිතා සේවා , මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට අදාළ විධිවිධාන<br><br>02. මහ නගර සභා , නගර සභා, ආඥා පනත් සහ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන පරිදි සම්මත කර ක්‍රියාත්මක කරනු ලබන පොදු අතුරු ව්‍යවස්ථා වල පුස්තකාල.ප්‍රජා ශාලා,මහජන සෞඛ්‍ය සනීපාරක්ෂාවට අදාළ විධිවිධාන |

| | | |
|---|---|---|
| | | 03. පළාත් පාලන ආයතනවල පොදු කළමනාකරණය ,මූල්‍ය කළමනාකරණය හා පොදු සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන විධිවිධාන හා ක්‍රියාමාර්ග<br><br>04. පළාත් පාලන සේවාවන් සම්බන්ධ අණපනත්<br>(මහ නගර සභා / නගර සභා ආඥා පනත්. ප්‍රාදේශීය සභා පනත්)<br><br>05. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය<br><br>06. 1987 අංක 42 දරණ පළාත් සභා පනත |
| මූල්‍ය රෙගුලාසි | පැය 03 | 01. රජයේ අරමුදල් හා ඒවා පාලනය වන ආකාරය<br>02. ඒකාබද්ධ අරමුදලින් මුදල් වියදම් කිරීම<br>03. ඒකාබද්ධ අරමුදල් රාජ්‍ය ආදායම්<br>04. අත්තිකාරම් ගිණුම් යටතේ කෙරෙන කටයුතු<br>05. රජයේ මුදල් පාලනය<br>06. පාඩු හා අත්හැර දැමීම්<br>07. තැන්පත් ගිණුම්<br>08. රජයේ මුදල්වල ආරක්ෂාව පිළිබඳ කාර්ය පරිපාටිය . සමීක්ෂණ මණ්ඩල, අග්‍රිම, බැංකු ගිණුම් හා අගරු කළ චෙක්පත් |

05. මෙම විභාගය පවත්වන දිනය හා ස්ථානය අපේක්ෂකයන්ට විභාග ප්‍රවේශ පත්‍ර මඟින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

**සබරගමුව පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරී II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026**

01. (I) මුලකුරු සමඟ නම:..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (මුලකුරු අගට යොදන්න උදා :- SILVA A.B.)

(II) සම්පූර්ණ නම:..........................................................................................................

(III) මුලකුරු සමඟ නම..........................................................................................................

(IV) රාජකාරි ලිපිනය :..........................................................................................................

..........................................................................................................
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(V) ස්ත්‍රී/පුරුෂ භාවය ................................................

(VI) දුරකතන අංකය :- රාජකාරි.................................... පෞද්ගලික....................................

(VII) ඉදිරිපත් වන විෂය/විෂයයන්:-

| විෂයය | විෂය අංකය |
|---|---|
| .............................................. | .................................... |
| .............................................. | .................................... |

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

03. උපන් දිනය :- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. (අ) ඔබ විමර්ශන නිලධාරි II ශ්‍රේණියට පත්වූ දිනය:-..................................................

(ආ) 2026.11.06 දිනට එම ශ්‍රේණියේ සේවා කාලය:-..................................................

05. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බවද ප්‍රකාශ කරමි.

දිනය :- ..............................................................
අපේක්ෂකයාගේ /අපේක්ෂිකාවගේ අත්සන

---

**II කොටස**

**(දෙපාර්තමේන්තු ප්‍රධානියා / ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.)**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................මහතා/මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන ස්ථිර තනතුරක් දරණ අයෙකු බවද, අයදුම්පත්‍රයේ අංක 01 සිට 04 දක්වා ඡේද යටතේ නිලධාරියා සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව හා මෙම කාර්යාලයේ ඇති වාර්තා අනුව නිවැරදි බවද මෙම නිලධාරියා කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති නිලධාරියෙකු බවද සහතික කරමි.

..................................
දිනය

..................................................
සහතික කරන අයගේ අත්සන
තනතුර
(නිල මුද්‍රාව තබන්න)